බන්ධ/කො/ජ/චක්‍රලේඛ අංක- 17 /2011

මගේ අංකය-කේ.01/02,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2011.09.14 වෙනි දින.

සියලුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර අධිකාරීන් වෙත.

## 2011 ජාතික සිරකරු දිනය වෙනුවෙන් පිරිනමන ලද විශේෂ රාජ්‍ය සමාව 2011-09-12

2011-09-12 වෙනි දිනට යෙදෙන ජාතික සිරකරු දිනය වෙනුවෙන් අතිගරු ජනාධිපති තුමා විසින් පහත දැක්වෙන පරිදි බන්ධනාගාර සිරදඬුවම් නියමව ඇති සිරකරුවන් සඳහා පොදු සමාවක් ප්‍රදානය කර ඇත.

01. 2011-09-12 දින වන විට බන්ධනාගාර ගතව සිටින අදාල සියළුම සිරකරුවන්ට ගෙවන ලද (ගත කරන ලද) වසරකට හා ඉන් කොටසකට සතියක් බැගින් (දින 07ක) සමාවක් ලබා දීම.

02. 2011-09-12 වෙනි දිනට සිරදඬුවම් විඳින, දඩමුදල් නොගෙවීම සම්බන්ධයෙන් බන්ධනාගාර ගතකරන ලද සිරකරුවන්ගේ ඉදිරියට ගෙවමින් පවතින දඬුවමේ ඉතිරි ශේෂය අහෝසි කිරීම.

03. 2011-09-12 වෙනි දිනට සිරදඬුවම ගෙවමින් සිටින වයස අවුරුදු 70 වැඩි සිරකරුවන්ගේ ඉදිරියට ගෙවමින් පවතින දඬුවමේ ඉතිරි ශේෂය අහෝසි කිරීම.

පහත දැක්වෙන වැරදි (වගන්ති) සඳහා සිරදඬුවම් විඳින සිරකරුවන්ට ඉහත සඳහන් අංක 01 හා 02 යටතේ දක්වා ඇති විශේෂ සමාව හිමි නොවේ.

| | වරද | දණ්ඩනීති සංග්‍රහයේ වගන්ති |
|---|---|---|
| I. | නීති විරෝධී රැස්වීම | 140 සිට 142 සහ 146 |
| II. | මංකොල්ල | 380,382 සහ 383 |
| III. | ගෙවල් බිඳීම සහ රාත්‍රී කාලයේ ගෙවල් බිඳීම | 431,432,440,441ගෙවල් බිඳීම<br>443 සහ 446 රාත්‍රිගෙවල් බිඳීම |
| IV. | රාජ්‍ය ද්‍රෝහී ක්‍රියා | 114- 123 |
| V. | පැහැරගෙන යාම | 354 - 360 |
| VI. | අසභ්‍ය ප්‍රකාශන ළමුනට අදාල ප්‍රදර්ශනය | 286 A |
| VII. | ළමුනට හිංසා කිරීම | 308 A |
| VIII. | ණය බැඳුම්කරයකට හෝ දාස භාවයට පත්කිරීම , බලහත් කාරයෙන් හෝ අනිවාර්යෙන් වැඩ ගැනීම, වහල්කමට භාජනය කිරීම සහ යුද්ධයේ යෙදවීම සඳහා ළමයින් බඳවා ගැනීම | 358 A |
| IX. | කුට්ටනය | 360 A |
| X. | ළමයින්ගෙන් අයුතු ලෙස ලිංගික ප්‍රයෝජනය ගැනීම | 360 B |

| | | |
|---|---|---|
| XI. | තැනැත්තන් වෙළදාම් කිරීම | 360 C |
| XII. | ළමයෙකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම | 360 E |
| XIII. | දූෂණය කිරීම | 364 |
| XIV. | ව්‍යාභිචාරය | 364 A |
| XV. | අස්වාභාවික ( වැරදි ) | 365 |
| XVI. | පුද්ගලයින් අතර ඇඩි අශිෂ්ට ක්‍රියා | 365 A |
| XVII. | බරපතල ලිංගික අයථා ක්‍රියා | 365 B |

XVIII. අල්ලස් පනත යටතේ වැරදිකරුවන් වූවන්

XIX. 1966 අංක 18 දරණ පීඩාකාරී ආයුධ පනතේ වැරදි

XX. ගිනි අවි ආඥා පනත යටතේ වැරදි

XXI. 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය මර්ධන (තාවකාලික) විධි විධාන පනත යටතේ වැරදි

XXII. 1982 අංක 24 දරණ ගුවන් යානා එරෙහි පනත යටතේ වැරදි

XXIII. විස, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥා පනත

XXIV. හදිසි නීතිය යටතේ වැරදිකරුවන් වූවන්

XXV. ආදායම් බදු නඩු වල මුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් සිරදඩුවම් විදින්නවුන්

XXVI. රේගු ආඥා පනත යටතේ වැරදිකරුවන් වූවන්

XXVII. ඉහත අංක 01 සිට ~~xxx~~ XXVI යටතේ දැක්වෙන වැරදි සම්බන්ධයෙන් යුධහමුදා පනත, නාවිකහමුදා පනත හෝ ගුවන් හමුදා පනත යටතේ යුද්ධාධිකරණය විසින් වැරදිකරුවන් කරනු ලැබූ අය.

XXVIII. 2005 අංක 25 දරණ ත්‍රස්තවාදි පනත උදෙසා මූල්‍යමය වශයෙන් ආධාර අනුබලදීම මර්දනය කිරීමේ සම්මුතිය යටතේ දඩුවම් ලැබූ පුද්ගලයින්. (Person convicted under the Convention for the Suppression of Financing of Terrorism Act No 25 of 2005

XXIX. වංචනික ලෙස උපයන ලද මුදල් වසං කිරීම - 2006 අංක 05 දරණ අඥා පනත, (Persons Convicted under the Prevention of money Laundering Act No:05 of 2006)

XXX. අයුතු මුදල් පරිහරනය, වාර්තාවීම් පනත - 2006 අංක 06 දරණ අඥා පනත, (Persons Convicted under Financial Transactions Reporting Act No:06 of 2006)

ඉහත සඳහන් විශේෂ සමාව අදාල වනුයේ 2011-09-12 වන දින වනවිට සැබවින්ම බන්ධනාගාර ගතව සිටින සිරකරුවන් කෙරෙහි පමණි. මෙම විශේෂ සමාව යටතේ නිදහස්වීමට සුදුසුකම් ලැබූ සිරකරුවන් වහාම නිදහස් කිරීමට කටයුතු කරන්න.

එක් සිරකරුවෙකුට ඉහත සඳහන් විශේෂ රාජ්‍ය සමාවෙන් හිමිවිය යුත්තේ එක් වරප්‍රසාදයක් පමණි.

මෙම විශේෂ සමාව සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්වයක් ඇති වුවහොත් වැඩිදුරටත් මාගෙන් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන්න.

විශේෂ සමාව යටතේ ඔබ ආයතනයෙන් මුදාහරිනු ලබන සිරකරුවන් සංඛ්‍යාව නොපමාව දුරකථන පණිවුඩයක් මගින් හෝ ෆැක්ස් පනිවුඩයක් මගින් දැනුම් දි නිදහස් කිරීමෙන් පසු ලිපියක් මගින් විස්තර සහිතව සනාථ කරන්න.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්